**වත්තේගම නගර සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වත්තේගම නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,154,760 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම නිවැරදිය හඳුනාගත නොහැකි වූ බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.33,077 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය උසාවි දඩ ආදායම නිවැරදිය හඳුනාගත නොහැකි වූ බව. | -එම- |
| (ඇ) | රු.400,000 ක් වටිනා ඖෂධ තොගයක් දෝෂ සහගත ලෙස පරිත්‍යාගයෙන් දායකවීමේ ගිණුමට බැර කර තිබුණි. | වැරදීමකින් පරිත්‍යාග ගිණුමට බැරකර ඇති බව. | -එම- |
| (ඈ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ එකතුව රු.2,000,000 ක ණයහිමි ශේෂය එම ගිණුමට හරකර සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනුවෙන් දක්වා අවිධිමත්ව සුභසාධක සේවා (6/81) අය ශීර්ෂයට බැර කර තිබුණි. පසුව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ඉටු නොකර දෝෂ සහගතව වියදම් හර කර ණයහිමියන් බැර කර තිබුණි. | විමසුම පරිදි ප්‍රතිපාදන සලසාගත් බව. | -එම- |
| (ඉ) | ඉකුත් වර්ෂවලදී වෙන්දේසි කර හා භාවිතයෙන් ඉවත් කර තිබුණු එකතුව රු.1,071,429 ක වාහන හා යන්ත්‍රෝපකරණ ඒකක 08 ක් තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගිවිසුමකට එළඹීමකින් හෝ ව්‍යාපෘති ආරම්භ කිරීමකින් තොරව ඉකුත් වර්ෂයේ වාහන අලුත්වැඩියා සඳහා රු.1,000,000 ක් හා සමාලෝචිත වර්ෂයේ දී ව්‍යාපෘති 03 ක් සඳහා රු.3,277,691 ක් ණයහිමි කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් හා වියදම් රු.3,277,691 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | අනුමැතිය ලැබුණු පසු අවශ්‍ය කටයුතු කිරීමට ණයහිමි කළ බව. | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.5,347,715 ක් වූ ගිණුම් ශේෂ 06 ක් භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ඉන්වෙන්ට්‍රි ලේඛනය, භෞතික පැවැත්ම සහ ශේෂ සනාථන ලිපි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී නිවැරදිව හඳුනාගෙන ලේඛන ඉදිරිපත් කරන බව. | ශේෂ තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන හා ලිපිගොනු පිළියෙල කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | කාලය ඉක්මවා තිබුණු රු.154,022 ක තැන්පතු ශේෂ 06 ක් නියාදනය කර නොතිබුණි. | මෙම මුදල් ලබා ගෙන ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,437,587 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,146,981 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,632,500 | 19,260,675 | 20,923,925 | 10,136,765 | 18,669,500 | 18,851,056 | 12,690,626 | 11,800,015 |
| (ii) | කුලී | 7,421,000 | 8,257,365 | 8,306,332 | 199,127 | 6,543,000 | 6,234,932 | 6,094,539 | 248,094 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,176,500 | 1,104,785 | 1,108,725 | 2,060 | 1,097,000 | 1,066,600 | 1,063,600 | 6,000 |
| (iv) | වෙනත් ආදායම් | 6,318,000 | 12,212,032 | 12,088,000 | 1,125,077 | 52,536,200 | 48,901,825 | 47,937,113 | 1,001,045 |
| | | 33,548,000 | 40,834,857 | 42,426,982 | 11,463,029 | 78,845,700 | 75,054,413 | 67,785,878 | 13,055,154 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.3,189,941 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 196 ක එකතුව රු.1,786,202 ක් විය. | වැඩසටහන් පවත්වා හිඟ අයකරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ වරිපනම් බදු අයකළ යුතුය. |
| (ii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2015 ජනවාරි 02 දිනැති තක්සේරු වාර්තාව අනුව 2022 වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | ඉදිරියේදී ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කරන බව. | නව තක්සේරු වාර්තා ලබා ගෙන අයකළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | කුඩුගල පාරේ පිහිටි අඩුකුලී නිවාස 10 ක 2019 වර්ෂයේ තක්සේරුව ක්‍රියාත්මක නොකර 1992 වර්ෂයේ තක්සේරුවක් පදනම් කරගෙන කුලී අය කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් සිට 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මාස 36 ක් සඳහා සභාවට රු.811,040 ක ආදායමක් අහිමි වී තිබුණි. | නව තක්සේරු වාර්තා අනුව කඩ කුලී අය කිරීමට කටයුතු කරන බව. | තක්සේරු වාර්තා අනුව නියමිත කඩ කුලිය අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2022 ජුනි 22 දින තක්සේරු වාර්තා අනුව සභාවට අයත් කඩ කාමර 14 ක කඩ කාමර කුලිය සංශෝධනය කර තිබුණද බදු ගිවිසුමේ 04 (iii) ඡේදයේ කොන්දේසි අනුව නව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගත වීමට දන්වා සිටියද එකඟතාවය පල නොකල බව. | නව තක්සේරුවට අනුව ගිවිසුම්ගත වී කුලී මුදල් අයකළ යුතුය. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.6,946,823 ක් වූ අතර, එක ඒකකය ජල ගාස්තු හිඟය රු.10,000 ඉක්මවූ ජල පාරිභෝගික ඒකක 168 කින් එකතුව රු.898,623 ක් විය. | විසන්ධි කිරීමේ නියෝග ක්‍රියාත්මක කර හිඟ අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අය කළ යුතුය. |
| (ii) | ජල පාරිභෝගිකයින් 757 ක් සඳහා ජල මනු සවිකර නොතිබුණු අතර මෙම පාරිභෝගිකයන්ගෙන් ගෘහස්ථ රු.400 ක් හා ව්‍යාපාර සඳහා 550 ක ස්ථාවර ගාස්තුවක් අය කිරීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී ජල මනු සවිකර ගාස්තු අයකරන බව. | ජල මනු සවිකර නියමිත ගාස්තු අයකළ යුතුය. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.325,077 ක් හා මුද්දර ගාස්තු රු.800,000 ක් විය. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකර ගන්නා බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර පාසලක්, සතිපොළක් හා ළමා උද්‍යානයක් යනාදී මහජන උපයෝගී සේවාවන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ප්‍රතිපාදන සලසා ගත් පසු මෙම ව්‍යාපෘති ඉටුකරන බව. | පනතේ කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ආ) | වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන්කරන ලද රු.4,888,750 ක සංවර්ධන යෝජනා 27 ක් ඉටුකර නොතිබුණි. | සභා යෝජනා අනුමත වී නොමැති නිසා මෙම ව්‍යාපෘති ඉටු නොකළ බව. | අයවැය ලේඛනයෙන් අනුමත කරන ව්‍යාපෘති ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් ජල ව්‍යාපෘති 03 ක 2019 වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E Coli) බැක්ටීරියා සාන්ද්‍රනය 30 – 760 දක්වා පරාසයක පැවති අතර නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 104 වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | ඉදිරියේ දී පරීක්ෂා කර වාර්තා කරන බව. | ජල සාම්පල් පරීක්ෂා කර පිරිසිදු කර ජලය බෙදාහැරිය යුතුය. |
| (ඈ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 118 වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගලී රථ සේවාවක් පවත්වාගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙනත් සභා වලින් ගලී රථ සේවාව ලබා ගැනීම සිදු කරන බව. | පනතේ කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ඉ) | ජලභීතිකා වැඩසටහන්, කසළ කළමනාකරණය, ඩෙංගු මර්ධන කටයුතු, සෞඛ්‍ය හා පාරිසරික සේවා හා ආහාර සාම්පල් පරීක්ෂාව යනාදී කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේ විෂයන් 05 ක් සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | ප්‍රතිපාදන ලබා ගත් බව. | ප්‍රතිපාදන ලබාගෙන අදාළ කාර්යයන් ඉටුකළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.12,842,274 ක් වූ අතර, ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.583,167 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.1,064,887 ක් විය. | අදාළ පාර්ශව දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.16,493,232 ක් වූ අතර ඉන් වසර 1 ත් 3 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.1,967,675 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.287,663 ක් විය. | ආදායමට ගැනීමට හා ගෙවීම් කටයුතු කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාතලේ පාර දුන්ඔය කුඹුර / පුස්සේපිටිය නොහොත් මියන්පාහේ වත්ත කසළ අංගන භූමියේ නිවාස 08 ක් අනවසරයෙන් ඉදිකර පදිංචිය සඳහා යොදාගෙන තිබුණි. | ඉදිරියේදී නිවාස පිළිසකර කර ලබා දීමට කටයුතු කරන බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | එකතුව රු.8,653,125 ක වාහන හා යන්ත්‍රෝපකරණ 07 ක් වසර 03 ත් 10 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | වෙන්දේසි කිරීමට හා අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | වෙන්දේසි කිරීමට හෝ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.2,982,977 ක් වැය කර 2020 ජූලි 06 දින වැඩ නිමකරන ලද ළමා පුස්තකාලය සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කර මෙම ස්ථානයේ ළමා පුස්තකාලය පිහිටුවීමට කටයුතු කරන බව. | ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගත යුතුය. |

**3.4 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.850,000 කට ඇස්තමේන්තු කර 2022 ජූලි 27 දින වැඩ ආරම්භ කර තිබුණු කොරහිටියාදෙණිය මාර්ගයේ කොටසක් ඉදිකර ඒ සඳහා රු.200,000 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | වැඩ අවසන් දිනය දීර්ඝ කරගෙන ඇති අතර ප්‍රමාද ගාස්තු අයකර ගන්නා බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 06 ක පුරප්පාඩු 08 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **සේවක ණය** | | |
| | 2021 ජූලි 28 දින විශ්‍රාම ගොස් තිබුණු නිලධාරියෙකුගේ රු.84,250 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇති බව. | ණය ශේෂ අයකරගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 02 කට අදාළව සියයට 24 ත් සියයට 75 ත් අතර විචලනයක් ද, වියදම් විෂයයන් 06 කට අදාළව සියයට 31 සිට සියයට සියය ඉක්මවා විචලනයක්ද, එක් එක් වැඩසටහන්වල වැය විෂයයන් 25 ක් සඳහා වෙන්කළ රු.4,266,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබීම ද හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | වැය ශීර්ෂවලට ප්‍රතිපාදන සැලසුවද ඉතිරි වී ඇති බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සළකා අයවැය පිළියෙල කළ යුතුය. |
| (ආ) | වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන් කිරීමකින් තොරව රු.2,894,925 ක සංවර්ධන ව්‍යාපෘති 13 ක් සමාලෝචිත වර්ෂයේ ඉටුකර තිබුණි. | මහා සභාව විසින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉටුකළ යුතු බව. | වාර්ෂික අයවැය ලේඛනයට අනුගත විය යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාළ කටයුතු ඉටුකරන බව. | තිරසර සංවර්ධන දර්ශක හඳුනාගෙන අරමුණු හා ඉලක්ක ඉටුකර ගත යුතුය. |